# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## දුම්රිය රක්ෂිත බදු ලබාගැනිමට ඉල්ලුම් කිරිම.

ඉදිරියේදි දුම්රිය රක්ෂිත බදු ඉල්ලුම් කිරිමේදි පහත ආකාරයට සිදු කල යුතුය.

01.සියලුම දුම්රිය රක්ෂිත බදු ඉල්ලීම් නියමිත ආකෘතියෙන් සිදුකල යුතු අතර එම ආකෘති පත්‍රය (railway.gov.lk) වෙබ් අඩවියෙන් බාගත කල හැක.ඊට අමතරව සියලුම දුම්රිය ස්ථානවල, දුම්රිය කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇත.අයදුම්කරුවන් හට ඉහත ආකෘතියට අනුව තමන් විසින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රයන් වුවද භාවිතා කල හැක.

02.අයදුම්පත්‍රය නිසි ලෙස පිරවිය යුතු අතර නියමිත ස්ථානවල අවශ්‍ය බලධාරින්ගේ සහතිකය විධිමත්ව සටහන් කල යුතුය.

03.බදු ලබා ගැනීමට අපේක්ෂිත රක්ෂිතයේ පිහිටිම මනා ලෙස නිශ්චිත වන පරිදි අයදුම්පත්‍රයේ 03 වන පිටුවේ ඇති ස්ථානයේ සැලසුම සැකසිය යුතුය.මෙය දළ සැලැස්මක් විය යුතු අතර ස්ථානය ඉතා නිශ්චිත වන පරිදි දුම්රිය දෙපාර්තුමේන්තුවට අයත් යම් නිශ්චල, නිශ්චිත සලකුණක සිට දුර මගින් පැහැදිලි විය යුතුය.

04.සියලුම රක්ෂිත ඉල්ලිම් පිළිබඳව සලකා බැලීමට නම් ඊට නියමිත අයදුම්පත්‍ර ගාස්තුව වන රු:5000/= මුදලක් ගෙවිය යුතුය.මෙම මුදල දුම්රිය මුලස්ථානය, කොළඹ 10 හි පිහිටි සරප් අංශය වෙතට හෝ දිවයින පුරා පිහිටි දුම්රිය ස්ථාන වලට ගෙවිය හැකිය.මුදල් භාර ගැනීමේදි අයදුම්කරන ඉඩම පිළිබඳව කිසිදු සොයා බැලීමක් සිදු නොකරන අතර අයදුම්පත්‍රය පිලිගෙන ලියාපදිංචි කිරීම සඳහා එම මුදල අයකරනු ලැබේ.එමෙන්ම අයකල මුදල කිසිදු හේතුවක් නිසා යලි ආපසු ගෙවිමක් හෝ බදු මුදලින් අඩු කිරිමක් සිදු නොවනු ඇත.

05.මුදල් ගෙවු රිසිට්පත ඇලවූ නිසිලෙස සම්පූර්ණ කල අයදුම්පත්‍රය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) - ඉඩම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) කාර්යාලය , දුම්රිය මුලස්ථානය, කොළඹ 10 යන ලිපිනය වෙත ගෙනැවිත් භාරදිම හෝ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

06.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) කාර්යාලයට අයදුම්පත්‍ර ලැබෙන පිලිවෙලට ලියාපදිංචි කර ගන්නා අතර එසේ ලියාපදිංචි කල බවට ලියාපදිංචි කල අංකයද සමඟ ඉල්ලුම්කරු වෙත දැනුම් දෙනු ලැබේ.

07.දෙපාර්තමේන්තුවේ පවතින ක්‍රමවේදය අනුව ඉල්ලිම පිළිබඳව ක්‍රියා කර අවසාන තීරණය බදුකරු වෙත දැනුම් දෙනු ඇත.

08.රක්ෂිතය බදු ලබාදීමට හෝ නොදීමට දෙපාර්තුමේන්තුව තීරණය කල විට ලියාපදිංචි කල බදු ඉල්ලීම පිළිබඳ කටයුතු නිමවන අතර ඒ සඳහා කල ගෙවීමද ඒ අනුව දෙපාර්තමේන්තු වියදම් වලට හිළව් වේ.

09.රක්ෂිතය බදු දීමට තීරණය වුවහොත් ඒ සඳහා බදු මුදල තීරණය කිරිම හා අනෙකුත් කොන්දේසි පැනවීම ඇතුලු ඉදිරි කටයුතු ආරම්භ වනු ඇත.

**දුම්රිය සාමාන්‍යාධිකාරි**